# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,899 — 1970 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද — 1970.3.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 281 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනතුරු-ඇබැර්තු ... ... ... | 283 | අය-වැය ලේඛන ... ... ... | 288 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 286 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 286 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දන්වීම ... | — | විවිධ දන්වීම ... ... ... ... | 290 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 16/64

### කහවත්ත සුළු නගර සභාව

සුළු නගර සභා ආඥපනත

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 129(ආ) වන වගන්තිය යටතේ හා එම වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කහවත්ත නගරය තුළ පිහිටි ප්‍රදේශය ඇතුළත මෙහි උප ලේඛනයේ නියමිත නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දෙකක් බැගින්වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කළ හැකි අන්දමට 1970 වර්ෂය සඳහා කහවත්ත සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දීය.

#### උපලේඛනය

අංක 1—නීලගම කොට්ඨාශය/නීලගම කෙළින් වීදිය : වරිපනම් අංක 36, 38, 40, 46, 48, 50, 52, 54, 58, 64/4, 64/5, 64/7, 68, 70, 72, 76, 92, 92/1/1, 94, 33, 35, 37, 43/1, 47, 53, 57

අංක 2—කහවත්ත කොට්ඨාශය/ක/කෙළින් වීදිය : වරිපනම් අංක 7, 15, 17, 19, 21, 23, 25, 27, 29, 31, 33, 35, 39, 39/1, 39/3, 43, 43ඒ, 45, 49, 53, 55, 55/2, 59, 61, 63, 63/1, 65, 69, 71, 73, 75, 79, 81, 83, 85, 97, 99, 101, 105, 107, 109, 111, 113, 115, 117, 119, 121, 123, 123/1, 123/2, 125, 125ඒ, 131, 133, 135, 137, 139, 141, 143, 145, 149, 149/1, 157, 159, 161, 163, 165, 167, 173, 175, 177, 177ඒ, 179, 181, 183, 183ඒ 185, 189, 189/1/1, 189/1, 191, 191/1, 191/2, 193, 195/1, 195/2, 199, 199/1, 199/2, 203, 205, 211, 217, 219, 221, 223, 225, 227, 231, 233, 235, 243, 245, 247, 251, 255, 259, 263, 267, 273, 285, 287, 299, 307

අංක 3—නුගවෙල කොට්ඨාශය/ක/කෙළින් වීදිය : වරිපනම් අංක 4/1, 4/3, 4/4, 4/6, 6, 8, 10, 12, 12ඒ, 14, 18, 20, 20ඒ, 26, 26/1, 28, 28ඒ, 28බී, 32, 34, 36, 38, 40, 42, 44/1, 46/4, 46/5, 46/6, 46/7, 48, 50, 54, 56, 58, 60, 62, 64, 66, 68, 70, 70/1, 74, 76, 78, 80, 82, 84, 84ඒ, 86, 86ඒ, 88, 90, 92, 94, 100, 102, 102/1, 104, 106, 106ඒ, 108, 108ඒ, 110, 112, 112ඒ, 114, 116, 118, 118/1, 120, 122, 122ඒ, 124, 124/1, 126, 126/1, 128/1ඒ, 128/2, 130, 134, 136, 138, 140, 142, 144, 148/1, 148/2, 148/3, 152, 154, 156, 158, 160, 160ඒ, 162, 164, 168, 168ඒ, 168/1, 168/7, 168/8, 168/9, 168/10, 168/11, 168/12, 168/18, 168/19, 168/20, 168/22, 168/23, 170, 172, 174, 178, 178ඒ, 180, 182, 184, 186, 188/1, 190, 194, 228/2, 262, 262/1

අළුත් පාර : වරිපනම් අංක 5, 9, 11, 15, 17, 21/1, 21/2, 21/3, 21/12, 21/13, 23/1, 25, 8, 10, 12, 14

පන්සල පාර : වරිපනම් අංක 25, 27, 29, 35, 37, 39, 41, 43, 24, 14, 34, 38

එළුවාන පාර : වරිපනම් අංක 2, 4, 8

හව්පෙ පාර : වරිපනම් අංක 1, 3, 5, 7, 2, 4, 6, 14, 16, 18

3–732—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සැම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ඇල්.ඩී.—බී.16/64.

## කහවත්ත සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා කසල ශෝධන විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 129 (ආ) වැනි වගන්තිය යටතේ හා ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කහවත්ත නගරය තුළ පිහිටා තිබෙන, සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනා කමින් සියයට හතරක් බැගින් වූ කසල ශෝධන විශේෂ වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කල හැකි අන්දමට 1970 වර්ෂය සඳහා කහවත්ත සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 16 වන දින,
කොළඹ දීය.

3–731—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 139/46.

## මාවතගම සුළු නගර සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මාවතගම සුළු නගර සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව, පළාත් පාලනය පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

"(267 වන අධිකාරය) වන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ මේ සභාව විසින්, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර තිබෙන) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක් පනවා අයකරනු ලැබේ:—

| බද්ද හැර ඇතුළුවීමේ ගාස්තුව (අයකරනු ලබන මුදල් ප්‍රමාණය) | බද්ද රු. | ශ. |
|---|---|---|
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... | 0 | 5 |
| (ආ) ශත 50 ට වැඩි වන නමුත් රු. 1 ට වැඩි නොවන විට ... ... | 0 | 10 |
| (ඇ) රු. 1 ට වැඩි වන නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... ... | 0 | 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි වන නමුත් රු. 2 ට වැඩි නොවන විට ... ... | 0 | 25 |
| (ඉ) රු. 2.00 ට වැඩි වන නමුත් රු. 2.50 ට වැඩි නොවන විට ... ... | 0 | 35 |
| (ඊ) රු. 2.50 ට වැඩි වන නමුත් රු. 3.00 ට වැඩි නොවන විට ... ... | 0 | 45 |
| (උ) රු. 3.00 ට වැඩි වන නමුත් රු. 4.00 ට වැඩි නොවන විට ... ... | 0 | 60 |
| (ඌ) රු. 4.00 ට වැඩි වන නමුත් රු 5.00 ට වැඩි නොවන විට ... ... | 0 | 75 |
| (එ) රු. 5.00 ට වැඩි වන නමුත් රු.10.00 ට වැඩි නොවන විට ... ... | 1 | 0 |
| (ඒ) රු. 10.00 ට වැඩි වන විට— | | |
| (1) පළමු රු. 10.00 ට ... ... | 1 | 0 |
| (2) එක් එක් අතිරේක රු. 5.00 ට හෝ ඉන් කොටසකට ... ... | 1 | 0" |

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 11 දින,
කොළඹ.

3–758—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපණතේ 17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම් සභා ආඥාපණතේ (257 වැනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, මන්නාරමේ පළාත් පාලන සහකාර කොමසාරිස් දේවරත්නම් ඩැන්පෝත් වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම් සභාවට සභාපති කෙනෙකු පත්කර ගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයේදී, 3 වැනි තීරුවේ සඳහන් වේලාවේදී 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේදී රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

දේවරත්නම් ඩැන්පෝත්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මන්නාරම.

පළාත් පාලන අමාත්‍යාංශයේ,
මන්නාරම, ප. පා. ස. කො. කාර්යාලයේදීය.
1970 මාර්තු මස 16 වැනි දින.

### උපලේඛනය

| 1 වැනි තීරුව<br>ගම් සභාවේ නම | 2 වැනි තීරුව<br>දිනය | 3 වැනි තීරුව<br>වේලාව | 4 වැනි තීරුව<br>ස්ථානය |
|---|---|---|---|
| මාන්තෙයි දකුණ ... ... ... | 70.4.7 ... | පෙ.ව. 10.30 ... | මාන්තෙයි දකුණ ගම් සභා කාර්යාලය, උයිලම්කුලම් |

3–743—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාව කාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යා කාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥා පනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදහරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශීක බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරු නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත් වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස ''නව ප්‍රවේශක නිලධාරීන්ටත්'' නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකිවන අතර, නියමිත කාල සීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අවම සුදුසුකම වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.

(ඈ) කාර්යක්ෂමතා කඩයිම.—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා ''නව ප්‍රවේශක නිලධාරීහු'' සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධි විධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් ''නව ප්‍රවේශක නිලධාරී'' යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නා වූ ''ආදි ප්‍රවේශක නිලධාරීන්'' කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදළ නොවේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—යෑම අයදුම්කරුවකු විසින් ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා ''ලාංකික'' යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශිය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාගන්නට තමන් සූදානම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතුය.

**(iii)** සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

**(iv)** කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

**(v)** යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

**(vi)** මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**(vii)** පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

**(viii)** අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

**සැ.යු.–(i)** අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

**(ii)** තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

**(iii)** පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

**(iv)** ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස

අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

**(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :**

**සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.**

**12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—**

**(අ) සිංහල :————.**

**(ආ) දෙමළ :————.**

**13. විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති **විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.**

**14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.**

**15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.**

**16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.**

**17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.**

**(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)**

**මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ** වැරදි බැව් **තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.**

————.

**අයදුම්කරුගේ අත්සන.**

**දිනය :————.**

**ලේකම්,**
**පළාත් පාලන සේවා කොමිෂන් සභාව,**
**තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.**

---

## පළාත් පාලන සේවය

### මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,288—23×144 සහ 8×180—රු. 8,040 ක් වේ. එහි රු. 4,584 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් ද, රු. 7,500 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ද ඇත.

**3. අවශ්‍ය සුදුසුකම් :—**

(අ) **වයස.**—1970.4.15 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුයි. උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.

(ආ) අයදුම්කරුවන් යෝග්‍ය පරිදි සුදුසුකම් ලත් සෞඛ්‍ය පරීක්ෂකයින් බව සනාථ කිරීම සඳහා රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතිකය හෝ රාජකීය සෞඛ්‍ය ආයතනයේ සහතිකය හෝ ඔවුන් වෙත තිබිය යුතුය. සහතිකයේ පිටපතක් එවිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව පිළියෙළ කොට, 1970.4.15 වැනි දිනට හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි :—

"(අ) සනීපාරක්ෂක කටයුතු පිළිබඳ සුදුසුකම් සම්බන්ධ විස්තර හා ඒ සුදුසුකම් ලබාගත් දින :————.

(ආ) දැනට රස්සාව පිළිබඳ විස්තර—

(i) දැනට දරන තනතුරේ පදවි නාමය හා ශ්‍රේණිය, ඊට පත්වුණ දිනය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කර ඇත්නම්, ඒ පිළිබඳ සේවා සටහන :————.

6. අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට, ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානම කට මුහුණ දෙති.

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නාමට නොවේ.

8. අවශ්‍ය සහතික පත්‍රවල පිටපත් අමුණා නොඑවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත.

9. නියමිත දිනට පසුව, රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිතුමා වෙත හෝ ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු දක්වමින්, ඒ අයදුම්පත්‍ර භාර ගන්නා ලෙස ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබුව හොත් මිස, සළකා බලනු නොලැබේ.

10. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 14 දින,
තැ. පෙ. 530,
කොළඹ.

3–725—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කම්බිකරු සහායක තනතුර—මතුගම සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය.**—රු. 2,154—8×54—2,586.

**3. අවශ්‍ය සුදුසුකම් :—**

(අ) වයස අවුරුදු 18 ත් 35 ත් අතර විය යුතුය.

(ආ) අයදුම්කරුවන් අඩු වශයෙන් සිංහල 7 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතුය.

(ඇ) අයදුම්කරුවෝ ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි ඇඹීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇඹීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අය විය යුත්තාහ.

නැතහොත්

(ඈ) අයදුම්කරුවෝ පළාත් පාලන ආයතනයක, ආණ්ඩුවේ ආයතනයක හෝ සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු 10 පළපුරුද්දක් ඇතිව සිටිය යුතුය. ඉහත (ඇ) කොටසේ සඳහන් සහතික ලබා ගත් පසු, නගර විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු දෙකක පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැළකිලි දක්වනු ලැබේ.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇති නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පල කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට 1970 අප්‍රේල් මස 25 වෙනි දිනට හෝ ඊට පළමු මතුගම සුළු නගර සභාවේ සභාපති තුමා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

දයා වී. පස්කුවල්,
මතුගම සුළු නගර සභාවේ සභාපති.

1970 මාර්තු මස 18 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්යාලයේ දීය.

3–724—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

**පළාත් පාලන ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1968.8.4**

අංක 14,889 හා 1970.1.16 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ iv වෙනි කොටසේ පළ වූ නිවේදනයට වැඩිදුරටත්ය. පහත නම සඳහන් අපේක්ෂකයා ද ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

9. ඒ. ඩබ්. චන්ද්‍රපාල—මොරටුව පළාත් ආණ්ඩු සභාව.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 13 දින,
තැ. පෙ. 530,
කොළඹ.

3–746—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## ගම්සභා ආඥාපනත

(257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වෙනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මෙගොඩපොත ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ 3 වෙනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 4 වන දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

### ගම්බද වෙළඳ පොළවල් හා පොළවල්

සභාව විසින් පාලනය කරනු ලබන ඌරාපොල පිහිටි ගම්බද වෙළඳ පොළවල් සඳහා ඒ එක් එක් ගම්බද වෙළඳ පොළේ සිට සැතපුම් එකක අර්ධ විශ්කම්භයක් ඇති කවයක් ඇතුළත වූ ප්‍රදේශය ඒ එක් එක් වෙළඳපොළේ වෙළඳ ප්‍රදේශය හැටියට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

2. සභාව විසින් පිහිටුවන ලද ගම්බද වෙළඳ පොළක යම් කඩ කාමරයක්, කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගන්නාවූ හෝ පාවිච්චි කරන්නාවූ සෑම තැනැත්තෙකු විසින් එසේ ප්‍රයෝජනයට ගැනීම හෝ පාවිච්චි කිරීම සඳහා මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් ගෙවිය යුතුය.

### සංචාරක වෙළෙන්දෝ

3. (1) සභාපති විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් පිට මිස කිසිම තැනැත්තෙකු විසින් සංචාරක වෙළෙන්දෙකුගේ ව්‍යාපාරය ආරම්භ කිරීම හෝ කරගෙන යෑම නොකළ යුතුය.

(2) සභාපති විසින් කලින් අවලංගු නොකරන ලද්දේ නම් එය, (1) ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මස 31 වැනි දිනට අවසාන විය යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ; සහ

"සභාව" යන්නෙන් කොළඹ දිස්ත්‍රික්කයේ මෙගොඩපොත ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| (1) වෙළඳ පොළ ගොඩනැගිල්ල තුළ හතරැස් අඩි 60 කට වැඩි නොවන කඩ කාමරයක් කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා දිනකට ... | 1 50 |
| (2) වෙළඳ පොළ භූමියෙහි කඩ කාමරයක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා— | |
| (අ) හතරැස් අඩි 10කට වැඩි නොවන විට ... | 0 35 |
| (ආ) එම 10 ට වැඩි 20 ට අඩුවන විට ... | 0 50 |
| (ඇ) එම 20 ට වැඩි 30 ට අඩුවන විට ... | 0 60 |
| (ඈ) එම 30 ට වැඩි 40 ට වැඩි නොවන විට ... | 0 65 |
| (ඉ) එම 40 ට වැඩි 50 ට වැඩි නොවන විට ... | 0 70 |
| (ඊ) එම 50 ට වැඩි 100 ට වැඩි නොවන විට ... | 0 75 |
| (උ) එම 100 ට වැඩිවන විට ... ... | 1 0 |
| (3) එළිමහන් බිමෙහි කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා— | |
| (අ) හතරැස් අඩි 10 කට වැඩි නොවන විට ... | 0 20 |
| (ආ) එම 10 ට වැඩි 20 ට වැඩි නොවන විට ... | 0 25 |
| (ඇ) එම 20 ට වැඩි 30 ට වැඩි නොවන විට ... | 0 30 |
| (ඈ) එම 30 ට වැඩි 40 ට වැඩි නොවන විට ... | 0 35 |
| (ඉ) එම 40 ට වැඩි 50 ට වැඩි නොවන විට ... | 0 40 |
| (ඊ) එම 50 ට වැඩි එහෙත් 100 ට වැඩි නොවන විට ... | 0 50 |
| (උ) එම 100 ට වැඩි වනවිට ... .. | 0 60 |

3–755—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ජී.—බී. 7/65.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටහිර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ,
1970 මාර්තු 11.

### අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැලකිය යුතුය :—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,
කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.
විනාකිරි සෑදීම,
සබන් සෑදීම,
දුම්කොළ වියලා සකස් කිරීම,
හම් පදම් කරන ස්ථානයක් තබාගැනීම,
පුවක් වියලා සකස් කිරීම,
ලේ හෝ අවමස් උණුකිරීම,
හම් හෝ ඇටකටු ගබඩා කිරීම,
රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සවීම හෝ සෑදීම,
කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
සෝඩා සෑදීම,
ලැලි පොගවා සකස් කිරීම,
මාළු අයිස් දැමීම,
සුරුට්ටු හෝ බීඩි සෑදීම,
රා එකතු කිරීමේ ස්ථානයක් තබාගැනීම,
පැනි සෑදීම.

2. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම,
කොප්පරා වේලීම,
කබොක් ගල් බොරළු හෝ කැටගල් ලබාගැනීමට ගල් වලවල් කැපීම,
මිනිරන් වියලා සකස්කිරීම හෝ ගබඩා කිරීම,
වලක් තැනීමෙන් හුණු ගල් හාරාගැනීම,

හාල් මෝලක් තබා ගැනීම,
යන්ත්‍රෝපකරණවලින් පොල් තෙල් හිඳීම.
සෙක්කුවකින් පොල්තෙල් හිඳීම,
ලී මඩුවක් තබාගැනීම,
කෙඳි වර්ග තෙලීම හෝ ගබඩාකිරීම,
කපු පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම,
මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැනීම,
කපාපු පොල් සකස් කිරීම,
ස්වර්ණාභරණ සෑදීම,
අම්ලකර වායුව පාවිච්චිකරන කම්මලක් තබාගැනීම,
පැඟිරි තෙල් හෝ කුරුඳු තෙල් හිඳීම,
කොප්පරා ගබඩා කිරීම,
කම්මලක් තබාගැනීම,
සිසිල් බීම සෑදීම,
කළුගල් කපන හෝ කඩන ස්ථානයක් තබාගැනීම.
වී කෙටීමේ යන්ත්‍රයක් තබාගැනීම.

3. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් සලකනු ලැබිය යුතුය :—

තෙල් වර්ග සායම් කිරීම,
ගඩොල් හෝ උළු නිෂ්පාදනය කිරීම;
බැටරි පිරවීම,

හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලිවලට කැඩීම, තෙල් හෝ වෙනත් ඉන්ධනයන් හෝ වාෂ්ප හෝ විදුලි බලය හෝ ප්‍රයෝජනයට ගෙන ක්‍රියා කරන යන්ත්‍රයකින් යුත් කම්මලක් තබා ගැනීම.

3–738—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 172/38

## හැටන්-දික්ඔය නගර සභාව

### නගර සභා ආඥපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ හැටන්-දික්ඔය නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥපනතේ 154 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 11,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

වෙළඳ පොළවල් සම්බන්ධයෙන් හැටන්-දික්ඔය නගර සභාව විසින් පනවනු ලැබ, 1962 ජනවාරි මස 18 වැනි දින අංක 12,881 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථාවල " ඉරිදා දිනයන් " යනුවෙන් යෙදෙන සෑම තැනටම " පෝය දිනයන් " යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3–737—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ බෝපේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබූ සහ ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 11 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

### ගොඩනැගිලි, මාසිම් තාප්ප සහ දොරටු මාර්ග සෑදීම

1. කිසිම තැනැත්තෙකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) යම් ගම්බද පාරක මැද සිට අඩි තිහක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ආ) යථා කාලයේදී ගම්බද පාරක් බවට පරිවර්තනය කරනු ලැබේයයි සභාව විසින් නිවේදනය කොට ඇති යම් ගම්බද අඩි පාරක මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් අඩි පාරක් හැර, අන් යම් ගම්බද අඩි පාරක මැද සිට අඩි දහයක දුර ප්‍රමාණයක් ඇතුළත,

කිසිම ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් නොසෑදිය යුතුය.

2. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය අනුව සභාපතිගෙන් ලබාගත හැකි පූර්ව අනුමැතිය නොමැතිව කිසිම තැනැත්තකු විසින් ගම් ප්‍රදේශය තුළ ගොඩනැගිල්ලක් සෑදීමට බලාපොරොත්තු ඉඩමේ මායිම්වල සිට අඩි අටක් ඇතුළත ගොඩනැගිල්ලක් නොසෑදිය යුතුය.

3. යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් සෑදීමට ආරම්භ කිරීම බලාපොරොත්තුවන දිනයට යටත් පිරිසෙයින් දින තිහකට කලින් ඒ අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් සභාපති වෙත ඉදිරිපත් කොට ඒ සඳහා අවසර පත්‍රයක් ඔහුගෙන් ලබා නොගත හොත්, 1 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ගම්බද අඩි පාරක් හෝ පාරක් අයිනේ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් සෑදීම හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදහස් කර තිබෙන ඉඩමේ මායිම්වල සිට අඩි අටක දුරක් ඇතුළත ඒ ගොඩනැගිල්ල ඉදිකිරීම කිසිම තැනැත්තකු විසින් ආරම්භ නොකළ යුතුය.

4. 3 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් ඉදිකිරීමට ආරම්භ කර තිබෙන විට ලියවිල්ලකින් වූ දැන්වීමක් ඔහුට භාර දෙනු ලැබීමෙන් ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටු මාර්ගය කඩාදමන ලෙස සභාපති විසින් ඔහුට නියම කළ හැකිය.

5. 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකු විසින්ම ඒ දැන්වීම ලැබී දින තිහක් ඇතුළත ඒ දැන්වීමේ සඳහන් ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටු මාර්ගය කඩා දැමීම හෝ කඩා දමනු ලැබීමට සැලැස්වීම කළ යුතුය.

### ප්‍රසිද්ධ දැන්වීම්

6. සභාවේ අණ පරිදි ප්‍රදර්ශනය කර තිබෙන කිසිම දැන්වීමක් විරූප කිරීම හෝ විනාශ කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

7. යම් දැන්වීමක සඳහන් කර තිබෙන නියමයන් ඕනෑකමින් උල්ලංඝනය කිරීම හෝ සභාවේ අතුරු ව්‍යවස්ථා යටතේ පටන් ගන්නා ලද යම් කර්මාන්තයක් කිරීමේදී සභාපති විසින් හෝ ඔහුගේ බලය යටතේ පිහිටුවන ලද යම් දැන්වීම් පුවරුවක්, වැටක්, කණුවක්, බාධකයක් හෝ වෙනත් දෙයක් ඉවත් කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

### වැසිකිළි තැනීම

8. (1) යම් ප්‍රදේශයක් තුළ මනුෂ්‍ය වාසය සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයක අයිතිකරු හෝ බදු ගැනුම්කරු විසින් එහි වැසිකිළියක් තනා පවත්වාගෙන යා යුතුයයි සභාව විසින් නිරූපණය කොට තිබේද, ඒ ප්‍රදේශයේ පිහිටි ස්ථානයක අයිතිකරු හෝ බදු ගැනුම්කරු වෙත ලිඛිත දැන්වීමක් භාරදීමෙන්, සභාව විසින් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන වර්ගයක හා ප්‍රමාණයක වැසිකිළියක්, භූමියෙහි එසේ නිශ්චය කොට සඳහන් කරනු ලබන ස්ථානයක නිශ්චය කරනු ලබන ක්‍රමයක සම්බන්ධ කරන කාණු සහිතව තනන ලෙස ඒ අයිතිකරුට හෝ බදු ගැනුම්කරුට සභාපති විසින් නියමකළ හැකිය.

(2) (1) වැනි ඡේදය යටතේ වූ දැන්වීමක් භාර දෙනු ලැබූ ස්ථානයක සෑම අයිතිකරුවකු හෝ බදුකරුවකු විසින්ම තමා වෙත ඒ දැන්වීම එසේ භාර දෙනු ලැබූ දින සිට දින තිහක් ඇතුළතදී ඒ දැන්වීමේ සඳහන් නියමයන්ට සෑම ලෙසින්ම අනුකූල වන වැසිකිළියක් තැනිය යුතුය.

9. සභාපතිගේ අවසරය ඇතිව මිස කිසිම තැනැත්තෙකු විසින් යම්කිසි ළිඳකින් අඩි එක් සියයක දුර ප්‍රමාණයක් ඇතුළත වළ සහිත වැසිකිළියක් තැනීම හෝ පවත්වාගෙන යෑම නොකළ යුතුය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

" සභාපති " යනුවෙන් සභාවේ සභාපති අදහස් කරනු ලැබේ,
" සභාව " යනුවෙන් බෝපේ ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් කරනු ලැබේ,
" ආඥපනත " යනුවෙන් (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනත අදහස් කරනු ලැබේ.
" ගම් ප්‍රදේශය " යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ බෝපේ ගම්සභාව අදහස් කරනු ලැබේ.

11. අංක 12,010 සහ 18. 12. 1959 දින දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ගොඩනැගිලි හා මායිම් තාප්ප තැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

3–736—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

ඇල්. ඞී.—බී. 139/46.

**සංශෝධනයයි**

**මාවනැල්ල සුළු නගර සභාව**

## 1969 වර්ෂයේ දෙවෙනි අතිරේක අය වැය ලේඛණය

(සාමාන්‍ය)

1969 දෙසැම්බර් මස 26 වෙනි දින අංක 14,886 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ පළවූ ඉහත සඳහන් අතිරේක අයවැය ලේඛණයේ යෝජනා අංකය හා දිනය 1969.10.31 වෙනි දින අංක 6 යනුවෙන් සංශෝධනය විය යුතු බැව් මෙයින් දන්වමි.

වී. තිලකරත්න,
වැඩ බලන සභාපති,
සුළු නගර සභාව, මාවනැල්ල.

1970. 2. 24 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කාර්‍යාලයේදීය.

අනුමත කරමි.

ජේ. පී. කිර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල.

1970 මාර්තු මස 12 දින,
කෑගල්ලේ, පළාත් පාලන අමාත්‍යාංශ
කාර්යාලයේ දී ය.

3–756—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## මාදම්පේ සුළු නගර සභාව

**1970 අය වැය ලේඛනය**

1969 දෙසැම්බර් මස 26 වැනි දින අංක 14,886 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළවූ මාදම්පේ සුළු නගර සභාවේ 1970 අය වැය ලේඛනය පහත සඳහන් ප්‍රකාර සංශොධනය විය යුතු බව මෙයින් දන්වමි:—

### I කොටස—සාමාන්‍ය අය වැය විස්තරය

**වියදම් ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (5) ලී බඩු ... ... ... | — | |
| (6) ණය ගාස්තු ... ... ... | 4,250 | 0 |

### II කොටස—විදුලි අංශයේ 1970 වේ අය වැය විස්තරය

**ආදයම් ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| 4. පාරිභොගිකයින් සඳහා කෙරෙන වැඩ ... ... | 6,000 | 0 |

එස්. සේගු ඉබ්‍රාහිම්,
සභාපති,
මාදම්පේ සුළු නගර සභාව.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
මාදම්පේ සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

අනුමත කරන ලදී.

ඇල්. ජී. ඊ. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හලාවත-පුත්තලම.

1970 මාර්තු මස 11 වැනි දින,
හලාවත, පළාත් පාලන අමාත්‍යාංශ කාර්‍යාලයේ දී ය.

3–750—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## මාවතගම සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් නීති 40 (ii) යටතේ අයදුම් පත්‍රය**

### 1970 වර්ෂයේ අයවැය ලේඛනය

**පලමුවැනි කොටස—සාමාන්‍ය**

1970 වර්ෂයේ අයවැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේ යයි ගණන් බලන ලද පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරු කර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා යෙදවීමට 1970.1.29 වැනි දින පැවති සභා රැස්වීමේදී, අංක 12 (10) දරණ සම්මුතිය අනුව තීරණය විය.

**මුදල් ඉතිරි වන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ජී) ජීවනාධාර ... ... ... | 1,415 | 0 |
| එකතුව ... | 1,415 | 0 |

**අතිරේක මුදල් අවශ්‍යවන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 2. ආයතන වියදම්— | | |
| (එල්) විවාහක නිලධාරීන්ට දීමනා ... | 1,020 | 0 |
| 4. දීමනා හා ආධාර ... ... | 50 | 0 |
| බී.—මහාමාර්ග :— | | |
| 14. විවාහක නිලධාරීන්ට දීමනා ... ... | 120 | 0 |
| ඞී.—මහජන සෞඛ්‍යය :— | | |
| 2. කැලිකසළ සේවය— | | |
| (බී) කරත්ත, ගොන්නු හා ලොරි ... ... | 225 | 0 |
| එකතුව ... | 1,415 | 0 |

**දෙවැනි කොටස—විදුලිය අංශය**

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී.—විදුලිය අංශය :— | | |
| 10. ජීවනාධාර ... ... ... | 210 | 0 |
| එකතුව ... | 210 | 0 |

| | රු. | ශ, |
|---|---|---|
| ඊඩී.—විදුලිය අංශය :— | | |
| 11. විවාහක නිළධාරීන්ට දීමනා ... | 210 | 0 |
| එකතුව ... | 210 | 0 |

හේරත් බී. ඒකනායක,
මාවතගම සුළු නගර සභාවේ සභාපති.

1970.2.22 වැනි දින,
මාවතගම සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරන ලදී.

දයානන්ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල.

1970.3.15 දින,
කුරුණෑගල පළාත් පාලන අමාත්‍යාංශ
කාර්යාලයේදීය.

3–735—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

## මාවනැල්ල සුළු නගර සභාව

### 1970 වර්ෂයේ දෙවෙනි අතිරේක අය වැය ලේඛනය (සාමාන්‍ය)

| වැය ශීර්ෂය | මුදල | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | රු. ශ. | 1970 පෙබරවාරි මස 27 වෙනි දින රැස්වීමේ අංක 4 දරන යෝජනාව |
| (1) නිළධාරී වැටුප් : | | |
| (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... ... | 300 0 | |
| (2) සංස්ථා වියදම් : | | |
| (කේ) කායඹාල භාණ්ඩ හා උපකරණ ... ... | 1,500 0 | |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (4) ගෝ ඝාතන ස්ථාන හා ගවහල් : | | |
| (බී) නඩත්තුව ... ... ... | 1,000 0 | |

ඒ. ඇල්. ඇම්. යූසුප්,
සභාපති, සුළු නගර සභාව, මාවනැල්ල.

1970 මාර්තු මස 2 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කායඹාලයේ දී ය.

අනුමත කරමි.

ජේ. පී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්.

1970 මාර්තු මස 16 වැනි දින,
කෑගල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

3–759—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## ලුණුගල සුළු නගර සභාව

### 1969 වර්ෂයේ පස්වැනි පරිපූරක අය වැය ලේඛනය

1969 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ශයන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේ යයි ගණන් බලන ලද පහත පෙනෙන වැය ශිර්ෂයන් යටතේ දක්වෙන මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ අනුමැතියට යටත්ව මාරු කිරීමට 1969 නොවැම්බර් මස 30 දින පවත්වන ලද ලුණුගල සුළු නගර සභාවේ මාසික මහා සභා රැස්වීමේදී සුළු නගර සභා මුදල් රෙගුලාසිවල 40 (II) වගන්තිය යටතේ සභා සම්මත කරන ලදී.

#### පළමුවැනි කොටස—සාමාන්‍ය

| ඉතිරි වැය ශීර්ෂය | | මුදල | අවශ්‍ය වැය ශීර්ෂ | | මුදල |
|---|---|---|---|---|---|
| | | රු. ශ. | | | රු. ශ. |
| ඒ.—1. (ජී) | ... | 1,035 01 | ඒ.—1. (ඒ) | ... | 600 0 |
| ඒ.—1. (එච්) | ... | 174 67 | ඒ.—1. (බී) | ... | 425 0 |
| ඒ.—2. (සී) | ... | 100 0 | ඒ.—1. (සී) | ... | 415 0 |
| ඒ.—2. (ඩී) | ... | 50 0 | ඒ.—1. (ඩී) | ... | 325 0 |
| ඒ.—2. (එෆ්) | ... | 200 0 | ඒ.—2. (බී) | ... | 100 0 |
| ඒ.—2. (කේ) | ... | 100 0 | බී.—1. (සී) | ... | 475 0 |
| ඒ.—2. (එම්) | ... | 200 0 | ඩී.—2. (ඒ) | ... | 859 18 |
| බී.—4. | ... | 150 0 | ඩී.—3. (ඒ) | ... | 660 0 |
| ඩී.—1. (එන්) | ... | 177 60 | ඩී.—5. (ඒ) | ... | 275 0 |
| ඩී.—2. (එෆ්) | ... | 100 0 | | | |
| ඩී.—2. (ටී) | ... | 538 18 | | | |
| ඩී. —7. (එෆ්) | ... | 100 0 | | | |
| ඩී.—2. (ජී) | ... | 202 0 | | | |
| ඩී.—3. (එච්) | ... | 314 96 | | | |
| ඩී.—3. (ජේ) | ... | 110 0 | | | |
| බී.—15. | ... | 53 50 | | | |
| බී.—13. | ... | 187 0 | | | |
| ඩී.—3. (අයි) | ... | 156 26 | | | |
| ඩී.—5. (ජේ) | ... | 55 0 | | | |
| ටී.—7. | ... | 58 0 | | | |
| ජී.—1. | ... | 72 0 | | | |
| එකතුව | ... | 4,134 18 | එකතුව | ... | 4,134 18 |

#### දෙවැනි කොටස—විදුලිය

| | | මුදල | | | මුදල |
|---|---|---|---|---|---|
| | | රු. ශ. | | | රු. ශ. |
| විදු.—10. | ... | 2,004 85 | විදු.—4. (බී) | ... | 2,004 85 |

1970.3.10 දින
ලුණුගල, සුළු නගර සභා කාර්යාලයේදීය

ජී. ඒ. වෝල්ටර් පෙරේරා,
සභාපති, සුළුනගර සභාව,
ලුණුගල.

අනුමත කරමි.

ටී. අයි. කමාල්දීන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1970.3.10 දින,
බදුල්ල,
පළාත් පාලන සහකාර කොමසාරිස්
කාර්යාලයේදීය.

3–747—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

### 1970 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය | යෝජිත වැය |
|---|---|
| | රු. ශ. |
| ඒ. 3—ආපසු ගෙවීම් | 10,500 0 |
| එකතුව ... | 10,500 0 |

1970.2.12 දින පැවැත්වූ සාමාන්‍ය රැස්වීමේදී සම්මත විය.

පී. කේ. විල්සන්,
සභාපති.

1970 මාර්තු 9 වෙනි දින,
සුළු නගරසභා කායඹාලය,
අකුරැස්ස.

අනුමත කරන ලදී.

ඔලිවර් ගුරුසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතර.

මාතර, 1970 මාර්තු 16 වෙනි දින.

3–740—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## ධර්ගා නගරය විශේෂ කොමසාරිස් කාර්යාලය

### 1970 පළමුවන පරිපූරක අය වැය ලේඛනය

#### 1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල් |
|---|---|
| | රු. ශ. |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | |
| (2) කැළි කසළ : | |
| (ඒ) වැටුප් | 430 0 |
| (බී) ගොන්, කරත්ත හා ලොරි | 1,000 0 |
| | 1,430 0 |

මගේ අංක 4 හා 70.3.14 දින දරණ තීරණය අනුව සකස් කොට සම්මත කරන ලදී.

කේ. ඇම්. අබේසිංහ,
විශේෂ කොමසාරිස්—ධර්ගා නගරය.

1970 මාර්තු මස 14 වැනි දින,
ධර්ගා නගරයේ
විශේෂ කොමසාරිස් කායඹාලයේ දීය.

3–739—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

## වත්තල-මාබෝලෙ නගරය

1 වන අතිරේක අය වැය—1970

| ශීර්ෂය හා උප ශීර්ෂය | මුදල රු. ශ. | |
|---|---|---|
| ජී.—සාමාන්‍ය වියදම් : | | |
| (3) ආපසු ගෙවීම් ... | 500 0 | විශේෂ කොමසාරිස්තැනගේ අංක 478 හා 70.3.11 දින නියෝගය |

| ශීර්ෂය හා උප ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| බී.—මංමාවත් : | |
| (11) මැනීම් | 1,000 0 |

ඇම්. බී. සමරකෝන්,
විශේෂ කොමසාරිස්,
වත්තල-මාබෝලෙ නගරය.

1970 මාර්තු මස 11 වැනි දින,
විශේෂ කොමසාරිස් කාර්‍යාලය,
වත්තල-මාබෝලෙ නගරය.

3-744—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## ලුණුගල සුළු නගර සභාව

1970 වර්ෂයේ වරිපනම් බදු ලේඛන

1970 වර්ෂය සඳහා වූ ලුණුගල සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එකී ලේඛන කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥපනතේ 235 (1) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ජී. ඒ. වෝල්ටර් පෙරේරා,
සභාපති,
සුළු නගර සභාව,
ලුණුගල.

1970 මාර්තු මස 17 වන දින,
ලුණුගල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

3-734—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## දළුගම සුළු නගර සභාව

ගෝඝාතක ආඥපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන දළුගම සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. ඩී. ඩේවිඩ්, දළුපිටිය, කඩවත | එළහරක් මස්, එළු මස්, ඌරු මස් ... | කිරිබත්ගොඩ |
| 2. ඩී. පී. අමරසිංහ, 105, නුවර පාර, දළුගම, කැළණිය ... | එළහරක් මස්, එළු මස්, ඌරු මස් ... | වරාකනත්ත |

ඩී. ඒ. පියදස,
සභාපති,
දළුගම සුළු නගර සභාව.

1970 පෙබරවාරි 1 වෙනි දින,
දළුගම සුළු නගර සභා කාර්යාලය,
මහර-කඩවත.

3-754—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## අඹගමුව උතුර ගම් සභාව—ගිනිගත්හේන

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (ගෝඝාතක) ආඥපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඒවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වෙනි පරිච්ඡේදයේ) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව උතුර ගම්සභා පාලන සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතු නිසාද, යන වග ලියවිල්ලකින් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ෂෙරිෆ්දීන් මොහමඩ් පාරුක්, පල්ලිය පාර, බගවන්තලාව ... | ටින්සින් බසාර්, බවගන්තලාව ... | හරක් මස් |

ඩබ්ලිව්. ජේ. ජිනදස,
අඹගමුව උතුර ගම්සභාපති.

1970 මාර්තු මස 10 වෙනි දින,
ගිනිගත්හේනේ,
අඹගමුව උතුර ගම්සභා කාර්‍යාලයේදීය.

3-753—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## 1952කෝ අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ කැකනදුර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963.6.21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරනලද් ආවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමතකරන ලද බව 1965.1.8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරනලද් ආවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට කැකනදුර ගම්සභාව විසින් පළාත් පාලන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 වන අධිකරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

පියසේන දහනායක,
කැකනදුර ගම්සභාපති තැන.

1970 මාර්තු 12 වැනි දින,
කැකනදුර ගම්සභා කාර්යාලයේ දී ය.

3-742—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

## තිස්සමහාරාම සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

තිස්සමහාරාම සුළු නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝගය පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නො වන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නො යනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (476 වෙනි අධිකාරය වන) ජලභීතිකා ආඥා පනතේ 11 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට හය මාසයක් ගත වන තුරු වලංගු වන්නේ ය.

ජී. පී. ආර්ලිස් සිල්වා,
තිස්සමහාරාම සුළු නගර සභාවේ
සභාපති.

1970.3.18 වැනි දින,
තිස්සමහාරාම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

3–761—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් එකී ස්ථානයේ 1970 වර්ෂයට එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වීමට ඇති හේතු සඳහන් කර, පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 1967 අංක 44 දරන සංශෝධිත වූ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

ඩී. පී. වික්‍රමසිංහ,
පිලැස්ස ගම්සභාවේ සභාපති තැන.

1970 මාර්තු මස 14 වැනි දින,
පිලැස්ස ගම්සභා කාර්යාලයේ දී ය.
මාවතගම.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| යූ. අබ්දුල් මජීඩ්, නො. 38, මාස්වැව කොළණිය, පිලැස්ස... | එළහරක් මස් ... | කුරුණෑගල-රම්බඩගල්ල පාරේ බරන්දර හන්දියේ ඇටගහවෙළ නැමැති ස්ථානයේ |

3–745—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## පිටිගල – වැයිහේන ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර වන උපලේඛනයෙහි සඳහන් අය විසින් සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධ වන පිටිගල–වැයිහේන ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියාඑවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ) 1947 අංක 44 දරන ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඒ. අයි. ඇම්. ජින්නා, 220, කෙලින් වීදිය, මතුගම ... | පිටිගල-වැයිහේන ගම් සභාවේ පිටිගල ඉරිද පොල පවත්වන ඉඩමේ පිහිටි මස් කඩ කාමරය | හරක් මස් |

ජේ. පී. ගජනායක,
පිටිගල-වැයිහේන ගම් සභාපති.

ගම් සභා කාර්යාලය,
වැයිහේන, මත්තක,
1970 මාර්තු 11.

3–757—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## කොලොන්නාව නගර සභාව

### මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් මස් වෙළඳාම් කිරීම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, එම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධවන, කොලොන්නාව නගර සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ විරුද්ධවන්නේ අසවල් කරුණු සඳහා යැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272) අධිකාරයේ 7 වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාමේ විස්තරය | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| ඇම්. ඇස්. ඇම්. යූසුප්, 36, දිගරොල්ල, මොරටුව ... | හරක් මස් විකිණීම ... | කොලොන්නාව පොදු වෙළඳ හලේ අංක 8 දරණ කඩ කාමරය. |

ගලගෙදරගේ සෝමසිරි,
කොලොන්නාව නගර සභාවේ සභාපති.

1970 මාර්තු මස 19 දින,
කොලොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

3–730—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

## නිකවැරටිය ගම්සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයෙහි 1970 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස්කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| යූ. ඇම්. රෂාක්, ඇඹිලගොඩසාගම, නිකවැරටිය | ගව මස් | නිකවැරටිය මහව ප්‍රසිද්ධ පාරේ සේරුගම මුල වත්ත නැමති ඉඩමේ පිහිටි ගොඩනැගිල්ල |

ජේ. පී. කරුණාතිලක,
නිකවැරටිය ගම්සභාවේ සභාපතිතැන.

1970 මාර්තු මස 19 වෙනි දින,
ගම්සභා කායර්‍ය‍ාලය,
නිකවැරටිය.

3–729—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනත

### (261 වන අධිකාරය)

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වන වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මුංවත්තබාගේ පත්තු බටහිර ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1-37 දක්වා වූ කාණ්ඩද, වළී 1963 ජූනි මස 21 වන දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරන කාණ්ඩය ද, වළී 1966 ක්වූ ජූලි මස 8 වන දින අංක 14,703 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1969 ජනවාරි මස 3 වන දින අංක 14,835 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූ ද එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 සහ 41 වන කාණ්ඩද මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට කළුතර දිස්ත්‍රික්කයේ මුංවත්තබාගේ පත්තු බටහිර ගම්සභාව විසින් පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ "261 වන අධිකාරය 3 වන වගන්තියේ" (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. ආරියසේන පෙරේරා,
මුංවත්තබාගේ පත්තු බටහිර ගම්සභාවේ සභාපති.

1970 මාර්තු මස 4 දින,
හල්තොට,
යාලගල ගම්සභා කාර්යාලයේ දී.

3–741—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත)

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ ගාළු දිස්ත්‍රික්කයේ අම්බණ-පිනිකහන ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"ගරු පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වන දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින්. අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක XXXIX, XL, හා XLI කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට අම්බණ-පිනිකහන ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ඩී. ඩී. සිරිවර්ධන,
සභාපති,
අම්බණ-පිනිකහන ගම්සභාව.

1970 මාර්තු මස 10 දින,
අම්බණ-පිනිකහන ගම්සභා කාර්යාලය,
කහදූව.

3-748—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## මුල්ලිපොතාන ගම් සභාව—ගන්තලාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අය එම උපලේඛනයෙහි දැක්වෙන අයුරු සඳහන් ස්ථානයෙහි 1970 වර්ෂයට මස්කඩ පවත්වා ගෙන යෑම සඳහා බලපත්‍ර ඉල්ලා ඇති බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මුල්ලිපොතාන ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුලත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුලත ලියා එවීමට බලය තිබෙන බව ගෝ ඝාතක ආඥාපනතේ (272 අධිකාරය වන වගන්තිය) යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඒ. අබ්දුල් රහීම්, 233, යුනිට් 7, මුල්ලිපොතාන, ගන්තලාව ... | එළහරක් මස් ... | 96, හන්දිය, ගන්තලාව |
| 2. | එම්. සදක් ලෙබ්බෙයි, 478, යුනිට් 17, තම්පලකාමම් දකුණ, තම්පලකාමම් ... | එළහරක් මස් ... | 98, හන්දිය, තම්පලකාමම් |

වයි. අබ්දුල් ජබාර්,
සභාපති, මුල්ලිපොතාන ගම් සභාව.

මුල්ලිපොතාන, ගන්තලාව්,
1970 මාර්තු 11 වෙනි දින.

3–752—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

## මාවතගම සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස බල පත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බල පත්‍රය නිකුත් කිරීම ගැන, මාවතගම සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහුගේ හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බවට මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | සතුන් මරණ ස්ථානය | වෙළඳාම හා මස් කඩය පිහිටි ස්ථානය |
|---|---|---|
| ඇම්. ඒ. කීර්තිසේන, සේන මෝටර්ස්, මාවතගම ... | සීෆිල්ඩ් වත්ත, මාවතගම ... | එළුමස්, කඩ කාමර අංක 2, පොදු වෙළඳපල, මාවතගම |

හේරත් බී. ඒකනායක,
මාවතගම සුළු නගර සභාවේ සභාපති.

1970 මාර්තු මස 10 වෙනි දින,
සුළු නගර සභා කාර්යාලය,
මාවතගම.

3–749—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ මහ නගර සභාව

### පිස්සු බලු උවදුර පිළිබඳ දැන්වීමයි

මාතලේ නගර සීමාව ඇතුලත පිස්සු බලු උවදුර ඇති හෙයින්, පෞද්ගලික ස්ථානයක්, මිදුලක් හෝ වත්තක් හැර වෙන ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක හෝ මාර්ගයක සිටින්නාවූ බැඳ නොතබන ලද හෝ කෙනෙකු විසින් ගෙනයනු නොලබන ඕනෑම බල්ලකු, මගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම කෙනෙකු විසින් සැනකින්ම විනාශ කර දැමීමට පිස්සු බලු ආඥා පනතේ (476 අධිකාරයේ) 11 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම ප්‍රකාශණය රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ සිට මාස හයකින් අවලංගු වේ.

ආර්. ඇම්. එල්. ඊ. පෙරේරා,
නාගරික කොමසාරිස්, මාතලේ.

මහ නගර සභා කාර්යාලය,
මාතලේ, 1970 මාර්තු මස 14 වෙනි දින.

3–727—70.3.26 දින අංක 14,899 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

### 1970

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 3.13 සිකුරාද | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 සිකුරාද | ... | 70 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 බ්‍රහස්පතින්ද | .. | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදද | ප.ව. | 3.30 |
| | | 70. 4.10 සිකුරාද | .. | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.17 සිකුරාද | ... | 70. 4. 8 බදද | ප.ව. | 3.30 |
| | | 70. 4.24 සිකුරාද | ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.30 බ්‍රහස්පතින්ද | ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | ... | 70. 5. 8 සිකුරාද | .. | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 5.15 සිකුරාද | .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.22 සිකුරාද | ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | .. | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.